## මනෝ විද්‍යාව

26

# අනුන් ගේ දරුවන් හද ගැනීම පිළිබඳ

## මානසික හා සාමාජීය ගැටලු

මනෝ විශේෂඥ වෛද්‍ය

**සරත් පඬුවාවල.**

අත් අය යන එන හැටි කත බොත හැටි ආදිය ගැන විමසිල්ලෙන් සිටින අප රට වැසියන් යුවලක් විවාහ වී අවුරුද්දක් හමාරක් යන විට ඔවුන්ට දරුවන් ලැබී ඇද්දැයි සොයා බැලීම සුලබ දෙයකි. යුවලගේ ඥාතීන් හා මිතුරන් මේ ගැන දක්වන උනන්දුව අති විශාල ය. දරුවන් නොලබන කාන්තාවන් "මුසල ගෑනුන්" ලෙස අප සමාජයේ සැලකේ. මෙවන් ආකල්ප නිසා බොහෝ කාන්තාවන් විවාහ වී අවුරුදු දෙකක පමණ කාලයක් ඇතුළත දරුවෙක් නොලැබුණොත් ඒ පිළිබඳ අසහනයට පත්වෙන අතර උපදෙස් පතා නාරිවේද විශේෂඥයන් කරා යති. සමහරු දේවාල ගානේ ගොස් යැදීම් ඇතුළු සම්ප්‍රදායික කටයුතුවල නිරත වෙති. දරුවන් ලැබීම පිළිබඳව මව හා පියා යන දෙදෙනාම වගකිව යුතු වුව ද, බොහෝවිට වඳ ගැහැනිය යනුවෙන් ගැරහුම් ලබන්නේ කාන්තාව යි.

මඳසරුභාවයට හේතු රැසකි. වයසත් සමග කාන්තාවන්ගේ සරුබව අඩු වන අතර වයස්ගත වී විවාහ වීම දරුවන් නොලැබීමට හේතු වෙනවා විය හැක. මඳසරුබවට හේතුවන සමහර තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීමට පුළුවන. සැමියාගේ හා බිරිඳගේ සොයා ගත හැකි කිසිම හේතුවක් නොමැතිව දරුවන් නොලැබෙන අවස්ථා නිතර දක්නට ලැබේ. මානසික පීඩන හා අසහන ආදිය ද මීට හේතුවිය හැකි ය. කෙසේ නමුත් මැදිවිය කිට්ටු වන විට දරුවන් ලැබීමේ ඉඩ බොහෝ අඩු වේ. මෙවැනි යුවලකට කළහැකි එකම දෙය වනුයේ වෙනත් අයෙකුගේ දරුවෙක් හද වඩා ගැනීම යි.

හදවඩා ගැනීම සඳහා බොහෝ විට ලැබෙන්නේ අත්හැර දමා ගිය දරුවන් ය. සමහර මව්වරුන් රෝහල්වල, පදික වේදිකා ඇතුළු ප්‍රසිද්ධ හෝ වෙනත් ස්ථානවල දරුවන් අත්හැර යති. මෙවැනි දරුවන් ළමා ආරක්ෂක සේවාවන් මගින් ඇති දැඩි කෙරේ. මීට අමතරව දෙමාපියන් මිය ගිය දරුවන් (උදා: යුද අරගල නිසා) හද ගැනීමට ලබා ගත හැකි ය. දුප්පත්කම නිසා දරුවන් රැසක් සිටින මවක් තම දරුවෙක් හද ගැනීමට අන් කෙනෙකුට භාරදෙන අවස්ථා තිබේ. තව ද යොවුන් වියේ පසුවන මවක් තම අවජාතක දරුවෙක් අන් කෙනෙකුට හද ගැනීමට භාර කරන අවස්ථා නිතර දක්නට ලැබේ.

දරුවන් අත්හැර යන දෙමව්පියන් ඇත්ත වශයෙන් ම මානසික වශයෙන් බැඳීම් ඉතා අඩු උදවිය යි. මොවුන් හද පත්ලෙන් ඇතිවන හැඟීම් නැති එනම් උණුසුම් හැඟීම් වලින් තොර අය යි. මොවුන් ගේ දරුවන් ද වැඩිවියට පත්වූ පසු එවැනිම පෞරුෂ ලක්ෂණ වලින් හෙබියවුන් වීමට ඉඩ ඇත. තව ද බුද්ධියෙන් ද අඩු දෙමව්පියන්ගේ මානසික ඌන වර්ධනයෙන් යුත් දරුවන් ද මෙසේ අත්හැර දමූ දරුවන් අතර සිටිය හැකි ය.

***යමෙක් දරුවෙක් දමා ගිය පලියට හා ඒ දරුවා වෙතින් සුන්දර බවක් පෙනුණු පමණින් ඔහු හෝ ඇය වයසින් මුහුකුරා ගිය විට තමා බලාපොරොත්තු වන අයුරින් සම්පූර්ණයෙන් සාමාන්‍ය පුද්ගලයෙක් නොවිය හැකි ය.***

තමා කිසිසේත් බලාපොරොත්තු නොවූ අවස්ථාවක දරුගැබක් ඇත්වීම කාන්තාවකට තදබල මානසික පීඩාවක් ඇතිවීමට පුළුවන. මෙවන් අවස්ථා රැසක දී ඒවා ගබ්සාවලට ලක්වීමට ඇති ඉඩ බොහෝය. එසේ නොවන විට දරුගැබ වැඩෙන තුරු මව එය දරා සිටිය යුතුය. මේ කාලය අතර තුර දී කාන්තාව දරුගැබ විනාශ කරන අටියෙන් නොයෙකුත් දේ කිරීමට පෙළඹේ. ඖෂධ වර්ග (හෝමෝන ඇතුළු) භාවිතා කිරීම හා නොයෙකුත් අනුචිත ව්‍යායාමවල යෙදීම මීට උදාහරණය යි.මෙම ක්‍රියා නිසා දරුගැබට හානි සිදුවීමට පුළුවන. නිසි කලට දරුවෙක් බිහි කළ ද එහි නොයෙකුත් අඩුපාඩු තිබීමට පුළුවන. යොවුන් වියේ පසුවන තරුණියකට අවජාතකව දරුගැබක් හටගැනීම ඇය පමණක් නොව ඇගේ දෙමව්පියන් ද පීඩාවට පත් කරවන්නකි. මුල් අවස්ථාවේදී තරුණිය උදරයට තදවූ ඇඳුම් ඇඳීම මගින් එහි වර්ධනය අන් අයට නොපෙන්වීමට උත්සාහ ගනී. මෙම අවස්ථාවේදී කලලයට අවශ්‍ය තරලය අඩුවීම නිසා ඊට හානි සිදුවිය හැකි ය. තම අනාගත තත්ත්වය ආරක්ෂා කර ගැනීම ගැන සිතන තරුණිය හා දියණියගේ අනාගතය අඳුරුවීම ගැන බියපත් වන දෙමව්පියන් ද කෙසේ හෝ කල්පනා කරන්නේ දරුගැබින් නිදහස් වීම ගැන යි. අවජාතක දරුවෙක් ලැබීම මෙරට වැසියන්ගේ සමච්චලයට හේතු වන්නකි. මෙවන් කරුණු නිසා මොන විධියේ පුරුෂ ලක්ෂණ වලින් සිටිය ද, දරුවා ලැබුණු පසු අන් කෙනෙකුට හද වඩා ගැනීමට දීම මෙවැනි මවක් මෙන් ම ඇගේ දෙමව්පියන් ද උත්සුක වනු ඇත.

මේ අනුව අත්හැර දමූ දරුවන් රැසක් ඌන මානසික වර්ධනයෙන් හෝ යහපත් පුරුෂ ලක්ෂණ වලින් අඩු අය බව ඔබට පෙනී යනු ඇත.

හද ගත් දරුවෙක් දෙස සමාජය බලන්නේ අවඥවෙනි. අහවලාගේ දරුවා අරං හද ගත් එකෙකැයි අන් අයට ද හඳුන්වා දෙයි. එවන් දරුවෙක් ඉගෙන ගන්නා පන්තියේ අනෙක් ළමෝ ඔහු හෝ ඇය අම්මෙක් අප්පෙක් නැති එකෙක් ලෙස පවසමින් හැල්ලුවට පත් කරති. කුඩා කල සිට මෙවැනි දෙයක් නොදන තමා හද වඩාගෙන ඇත්තේ තමාගේ නියම අම්මා සහ තාත්තා බව සිතන දරුවාට මෙවැනි දෙයක් ඇසීම සිත් කම්පා කරවන්නකි. මෙය සත්‍යයක් දැයි සොයාගත නොහැකිවුන දරුවා අතිශයින් මානසිකව පීඩාවට පත් වේ. වෙනද, නොදැනුණත් අනාරක්ෂිත බවක් ඔහුට හෝ ඇයට දැනෙයි. තමා හද ගත් දෙමව්පියන් කෙරෙහි නොරුස්නා සුළු බවක් දක්වයි. ඔවුන් දෙන අවවාද පෙනෙන්නේ තමන් කෙරෙහි නොකමැත්තෙන් දෙන ඒවා ලෙස යි. ඔවුන් විසින් තමන් හද වඩා ගනු ලැබුව ද නියම දරුවෙක් ලෙස තමාට නොසලකන බවක් හැඟී යයි. කාන්සාවෙන් ශෝකයෙන් පෙළෙන ඔහු හෝ ඇය පාසල් යාම ප්‍රතික්ෂේප කරයි. මානසිකව රෝගී වෙයි.

උග්‍ර මානසික රෝගවලින් පෙළෙන්නන් අතර අස්වාභාවික විශ්වාස සුලබ ය. එවැනි මානසික රෝගවලින් පෙළෙන දරුවන් සමහර දෙනෙක් තම දෙමව්පියන් නියම අම්මා හෝ තාත්තා නොවන බව තදින් විශ්වාස කරන අතර ඔවුන්ට හිරිහැර කිරීමට ද පෙලඹේ. රෝගය සුව වූ විට මෙම තත්ත්වයෙන් ඔවුහු මිදෙති. බොහෝ දෙමව්පියෝ වයස්ගත වී කරකියාගත නොහැකි වූ අවදියක තම දූ දරුවන්ගේ රැකවරණය බලාපොරොත්තු වෙති. දරුවන් නොමැති සමහර දෙමව්පියන් වෙනත් අයගේ දරුවන් හද වඩා ගන්නේ මේ අරමුණින් විය හැකි ය. වයස් ගත දෙමව්පියන්ට තමන්ගේ ම දරුවන් ද නොසලකා හරින අවස්ථා මෙකල සමාජයේ නිතර දක්නට ලැබේ.

69 පිටුවට

# අනුන්ගේ...

26 පිටුවෙන්

දෙමව්පියන් හරිහම්බ කළ දේපොළ වස්තුව ලබා ගත් පසු ඔවුන් මහලු නිවාස කරා ගෙන ගොස් දමන දූ පුතුන් ගැන නිතර අසන්නට ලැබේ. තමන්ගේ ම දරුවන්ට වඩා හදා ගත් දරුවන් දෙමව්පියන්ට සලකන අවස්ථා ද එමට තිබේ. නමුත් වැඩියෙන් දක්නට ලැබෙන්නේ හදා ගත් දරුවන් තමන් ඇති දැඩි කළ අයට නොසලකා හැරීම යි. ඇත්තෙන් ම මෙවැනි අවස්ථාවලදී දරුවා හදා ගත් දෙමව්පියන්ට ඇති වන මානසික පීඩනය අතිමහත් ය. මෙහිදී ඔවුහු කම්පා වන්නේ මෙවැනි අයෙක් තමන් විසින් කවා පොවා උගන්වා ඇති දැඩි කිරීම පිළිබඳව වන අතර තමන් එසේ නොකළා නම් මෙවන් වේදනාවක් ඇති නොවන බව ඔවුන් සිතනවා විය හැකි ය. ඇත්තෙන් ම මෙවැනි අවස්ථාවකදී ඇතිවන මානසික පීඩනය තමාගේ ම දරුවෙක් නොසැලකීමට වඩා වැඩි විය හැකි යි. සමහර දෙමව්පියන් තමන් විසින් හදා ගන්නා දරුවා ලොකුමහත් වන විට මන්දබුද්ධිකයකු හෝ ආබාධිතයෙක් වීම අත්දකිති. මෙවැනි දෙමව්පියන්ට ඇතිවන ඉච්ඡාභංගත්වය හා අසහනය අතිමහත් ය.

මෙකල බොහෝ අය බල්ලන් ඇති දැඩි කිරීම වුවත් කරන්නේ උන්ගේ පැටිකිරිය සොයා බැලීමෙනි. ඇත්තෙන් ම පැටිකිරිය එනම් ප්‍රවේණිගත සාධක පිළිබඳව සොයා බැලීම ඉතා වැදගත් ය. ඇත්තෙන්ම අප රටේ දරුවන් හදා ගැනීමේ දී එවැන්නක් සොයා බැලීම ඉතාමත් අපහසු කරුණකි. දරුවන් හදා ගැනීම සඳහා බොහෝවිට ඔවුන් බලන්නේ ගැහැනු පිරිමි බව හෝ බාහිර පෙනුම ආදිය යි. එනිසා යමෙක් දරුවෙක් දමා ගිය පළියට හා ඒ දරුවා වෙතින් සුන්දර බවක් පෙනුණු පමණින් ඔහු හෝ ඇය වයසින් මුහුකුරා ගිය විට තමා බලාපොරොත්තු වන අයුරින් සම්පූර්ණයෙන් සාමාන්‍ය පුද්ගලයෙක් නොවිය හැකි ය. මෙවන් දරුවන්ගේ මානසික ආබාධිත තත්ත්ව සාමාන්‍ය දරුවන්ට වඩා වැඩි විය හැකි යි.

❑